මැණිකේ ඊ. ආර්. ඩී.
PAPER

# ප්‍රාදේශිය සභා මැතිවරණයේදී තරුණ පරම්පරාවෙහි දායකත්වය පිළිබඳ අධ්‍යයනයක් (රඹුක්කන ප්‍රාදේශිය සභාව ඇසුරින්)

ඊ. ආර්. ඩී. මැණිකේ, ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය

ශ්‍රී ලංකාවේ පළාත් පාලනයේදී ප්‍රාදේශිය සභාව  සුවිශේෂි වෙයි. ප්‍රාදේශිය සභාව පිහිටුවීමේ එක් අරමුණක් වුයේ ග්‍රාමිය ජනතාව දේශපාලන ක්‍රියාකාරකම් සඳහා සහභාගී කර ගැනීමයි. වර්තමානයෙහිදි තරුණයින් විවිධ දේශපාලන ක්‍රියාකාරකම් සඳහා සහාභාගි කරවා ගැනීමෙහි අවශ්‍යතාව මතුවී ඇත. එවන් තත්ත්වයකදි ඉහත පර්යේෂණය සිදුකිරිම කාලීනව වැදගත් වී ඇත.

අධ්‍යයන ගැටලුව වුයේ 2011 මාර්තු මස පැවති ප්‍රාදේශීය සභා මැතිවරණයෙහිදී දුනුකේවල සහ වඩුවාදෙණිය වසම්හි ජීවත්වන තරුණ තරුණයින්ගේ දායකත්වය කෙසේ  සිදුවී තිබේ ද යන්නයි. අධ්‍යයන අරමුණ වන්නේ 2011 මාර්තු මස පැවති ප්‍රාදේශීය සභා මැතිවරණයෙහිදී දුනුකේවල සහ වඩුවාදෙණිය වසම්හි ජීවත් වන තරුණ තරුණයින්ගේ දායකත්වය ලැබී තිබේ දැයි පර්යේෂණාත්මකව අධ්‍යයනය කිරිමයි. ඒ තුළින් වඩුවාදෙණිය සහ දුනුකේවල වසම්හි තරුණ පරම්පරාවෙහි දේශපාලන සහභාගිත්වය පිළිබඳ දළ අදහසක් ලබාගැනීම. අධ්‍යයන සීමා වන්නේ රඹුක්කන ප්‍රාදේශීය සභාව පමණක් තෝරා ගැනීම, වඩුවාදෙණිය සහ දුනුකේවල වසම් පමණක් යොදා ගැනීම, තරුණ තරුණියන් 360 ක් පමණක් යොදා ගැනීම.

තොරතුරු  රැස් කිරිමේදි ප්‍රාථමික දත්ත සහ ද්විතීයික දත්ත යනුවෙන්  දත්ත වර්ග 2 ක් උපයෝගී කර ගැණිනි. ප්‍රාථමික දත්ත ලබාගැනීමේ දී තෝරාගත් වසම් දෙකෙහි  තරුණ තරුණියන් 30 බැගින් 360 ක් යොදා ගැණිනි. එහිදී තොරතුරු ලබාගැනීම සඳහා ප්‍රශ්ණාවලි ක්‍රමය උපයෝගී කර ගැණිනි. විස්තරාත්මක විග්‍රහයක් සිදු කෙරිණි. අහඹු නියැදිය යොදා ගැණිනි. දුනුකේවල වසමත්, වඩුවාදෙණිය වසමත් තෝරා ගැණිනි. දුනුකේවල වසමෙහි තරුණ තරුණියන් 360ක්ද වඩුවාදෙණිය වසමෙහි 120ක්ද යොදා ගෙන ඇත. ඉහත පර්යේෂණාත්මක අධ්‍යයනයෙහිදී අවධානය යොමු කරන සාධක 4 ක් තෝරාගෙන ඇත. එම සාධක 4 සම්බන්ධව 2011 මාර්තු මස පැවති ප්‍රාදේශීය සභා මැතිවරණයේදී තරණ පරම්පරාවෙහි දායකත්වය සිදුවී ඇති ආකාරය පිළිබඳව පර්යේෂණාත්මකව අධ්‍යයනය කෙරිණි.

මේ අනුව නිගමනය කළ හැකි වන්නේ ප්‍රාදේශීය සභා මැතිවරණයේදී අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත් වීමේදී දුනුකේවල සහ වඩුවාදෙණිය වසම්හි තරුණ තරුණියන්ගේ සහභාගිත්වය නොමැති බවත් ඡන්දය පාවිච්චි කිරීමේ දී ඉහළ මට්ටමේ සහභාගිත්වයක් දක්නට ලැබෙන බවත් ඡන්ද අපේක්ෂකයාගේ හෝ පක්ෂයක හෝ ප්‍රචාරක ක්‍රියාවලියට සහභාගි වීමේදී ත් මැතිවරණ රැස්වීම්වලට සහභාගි වීමේදී ත් තරුණයන්ගේ මධ්‍යස්ථ මට්ටමේ සහභාගිත්වයක් තරුණියන්ගේ පහළ මට්ටමේ සහභාගිත්වයක් සිදුව ඇති බවයි. දුනුකේවල සහ වඩුවාදෙණිය වසම්හි තරුණ තරුණියන් දේශපාලන ක්‍රියාකාරකම් පිළිබඳව විධිමත්ව දැනුවත් කළ යුතුයි. තරුණ තරුණියන් දේශපාලන ක්‍රියාකාරකම් කෙරෙහි සහභාගි කරවා ගැනීමට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් උනන්දු විය යුතුයි. පක්ෂ භේදයකින් තොරව තරුණ පරම්පරාවගේ දායකත්වය ලබාගැනීමට  පක්ෂ සංවිධායක / බලයේ සිටින නායකයින් විසින් ක්‍රියාකිරීමයනාදියයි.